# ඡායා රූ පිළිසඳර

2010 අගෝස්තු / සැප්තැම්බර්

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අධ්‍යාපන හා තොරතුරු ප්‍රකාශනය

**Educational and News Bulletin of The National Photographic Art Soceity of Sri Lanka**


## සංගමයේ 60 වන සංවත්සර සැමරුම් උළෙල පිළිබඳ පැවැත්වෙන විශේෂ මහා සභා රැස්වීම

නොවැම්බර් මස මුල් සතියේ කොළඹ දී පැවැත්වෙන සංගමයේ 60 වන සංවත්සර උළෙලේ සංවිධාන කාර්යයන් පිළිබඳ සාකච්ඡා කරගැනීමේ අරමුණින් විශේෂ මහා සභා රැස්වීමක් ඔක්තෝබර් මස 17 දින කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේ දී පැවැත්වේ. මේ සඳහා ඔබගේ පැමිණීම අත්‍යවශ්‍ය ම බව කාරුණික ව සලකන්න. සංගමයට ඔබගේ අතහිත දීම, කැපවීම අත්‍යවශ්‍ය ම මොහොත මෙය බැවි ඊට ආදරය කරන ඔබට අමුතුවෙන් සිහිපත් කළ යුතු නොවේ.

## 15 වන ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශනය



සංගමයේ 60 වන සංවත්සර උළෙලට සමගාමී ව පවත්වනු ලබන FIAP අනුමැතිය ලත්, සංගමයේ 15 වන ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශනය 2010 නොවැම්බර් මස 05, 06 සහ 07 වන දිනවල කොළඹ ප්‍රදර්ශන හා සම්මේලන මධ්‍යස්ථානයේ දී (SLECC) පැවැත්වේ.

මෙම ඡායාරූප තරගයේ කෘති ඇගයීම පසුගිය දා සිංගප්පූරු ජාතික ප්‍රවීණ ඡායාරූප කලාවේදී Tan Lipsen මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණ.

## 57 වන වාර්ෂික මහා සභා රැස්වීම



අප සංගමයේ 57 වන වාර්ෂික මහා සභා රැස්වීම 2010 ජූනි මස 20 වන ඉරු දින කොළඹ 7 ආනන්ද කුමාරස්වාමි මාවතේ, නවනගර ශාලාවේ දී පැවැත්විණි. එහි දී නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කරගත් අතර එම විස්තර මෙසේ ය.

සභාපති - T.G. සුනිල් වික්‍රම මහතා
විධායක අධ්‍යක්ෂ - T.S.T. ද සිල්වා මහතා
මුදල් අධ්‍යක්ෂ - මංගල එදිරිසිංහ මහතා
ලේඛකාධිකාරි - විජය බස්නායක මහතා
අධ්‍යාපන අධ්‍යක්ෂ - සිතුමිණි රත්නමලල මහතා
ප්‍රදර්ශන අධ්‍යක්ෂ - N.R. අභයසිංහ මහතා
ප්‍රකාශන අධ්‍යක්ෂ - නාරද අමරතුංගආරච්චි මහතා
අධ්‍යක්ෂ සුබසාධන - සුනිල් ලියනගේ මහතා
අධ්‍යක්ෂ සංවර්ධන ප්‍රවර්ධන - ශාන්ත ගුණරත්න මහතා


ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
තැ.පෙ. 452, කොළඹ

# National Photographic Festival

## 60 වන සංවත්සර ජාතික ඡායාරූප ශිල්ප උළෙල

අප සංගමයේ 60 වන සංවත්සරය නිමිත්තෙන් සංවිධානය කෙරෙන ජාතික ඡායාරූප ශිල්ප උළෙල නොවැ 05, 06, 07 දිනවල කොළඹ 10 ඩී.ආර්. විජේවර්ධන මාවතේ ප්‍රදර්ශන සහ සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වෙනු ඇත.

FIAP ඡායාරූප ප්‍රදර්ශනය, ඡායාරූප ශිල්ප අධ්‍යාපනික ප්‍රදර්ශනය, මංගල ඡායාරූපකරණය, ඩිජිටල් ඡායාරූපකරණය පිළිබඳ විශේෂ ඉදිරිපත් කිරීම්, ඡායාරූප ශිල්පයේ සෑම අංශයක් ම නියෝජනය වන ප්‍රදර්ශන කුටි, සිනමා රූපවාහිනී මාධ්‍ය කුටි, විලාසිතා සහ මංගල ඡායාරූපකරණ සැසිවාර, ඡායාරූප ශිල්ප වැඩමුළු, ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණ තිරගත කිරීම්, ඡායාරූප ශිල්ප පොත් දොරට වැඩීම් ඇතුළු විවිධාංග ගණනාවක් මෙයට අඩංගු කිරීමට සැලසුම් සකස් කෙරෙමින් තිබේ.

ප්‍රදර්ශන කුටි සියයකට අධික සංඛ්‍යාවකින් ද යුතු මෙම උළෙල අභිමානවත් ලෙස පැවැත්වීමට ඔබගේ දායකත්වය සහ කැපවීම අත්‍යවශ්‍ය වේ. ඔබ අවංක වූ අධ්‍යාශයෙන් සංගමය වෙනුවෙන් කරන කැපකිරීම සඳහා මේ හොඳ ම අවස්ථාවයි. ඔබේ දායකත්වය සංගමයට අවශ්‍ය ම වන මොහොත මෙම උළෙලයි.

## 60වන සංවත්සර සැමරුම් මුද්දරය

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ 60 වන සංවත්සරය අළලා සැමරුම් මුද්දරයක් නිකුත් කිරීමට විධිවිධාන යොදා ඇත. මුද්‍රණය කරනු ලබන්නේ ඇණවුම් කරන මුද්දර සංඛ්‍යාව පමණක් බැවින් ඔබට මෙම සැමරුම් මුද්දරය අවශ්‍ය නම් 071-4402950 අංකයෙන් අශෝක බුද්ධදාස මහතා අමතා ඔබේ ඇණවුම තහවුරු කරන්න. රු 5/=- ක මුද්‍රිත මිල වටිනාකමක් සහිත මෙම මුද්දරය, තැපැල් දෙපාර්තමේන්තුව වෙතින් අපට ලබාගත හැකි වන්නේ රු 100/-= ක මුදලකට බැවි කරුණාවෙන් සලකන්න. මුද්දරය 60 වන සංවත්සර උළෙල සමාරම්භක අවස්ථාවේ නිල වශයෙන් නිකුත් කෙරේ.

### සමරු මුද්දරය සහ සමරු ටී ෂර්ටය ලබාගැනීම

60 වන සංවත්සරය අළලා නිකුත් කෙරෙන සමරු මුද්දරය (එක් මුද්දරයක් රු. 100/=) සඳහා මුදල ද එම ව්‍යාපෘතිය භාරව කටයුතු කරන අශෝක බුද්ධදාස (071 - 4402950) මහතාට ලබාදීමෙන් ඔබේ සැමරුම් මුද්දරය වෙන්කරවා ගත හැකි ය. එමෙන් ම එම සංවත්සරය අළලා නිකුත් කෙරෙන සමරු ටී ෂර්ටය ද රු. 500/= ක් අශෝක බුද්ධදාස මහතාට ලබාදීමෙන් ඇණවුම් කළ හැකි ය.

### 60 වන සංවත්සර යාවජීව සාමාජිකත්ව ප්‍රවර්ධන ව්‍යාපෘතිය

අප සංගමයේ 60 වන සංවත්සරය නිමිති කොට ගෙන දැනට සාමාජිකත්වය අහෝසි වී ඇති පැරණි සාමාජිකයින් සඳහා යාවජීව සාමාජිකත්‍වය පිරිනැමීමේ විශේෂ කාල සීමාවක් ප්‍රකාශයට පත් කිරීමට තීරණය කෙට ඇත. ඒ අනුව දැනට සාමාජිකත්වය අහෝසි වී ඇති එහෙත් යළි සංගමයට සම්බන්ධවීමට කැමැත්තෙන් පසුවන සහ වසර පහකට වැඩි කාලයක් සංගමයේ ක්‍රියාකාරී සාමාජිකයින් වශයෙන් කටයුතු කළ අයට මේ සඳහා ඉදිරිපත් විය හැකි ය. ජූනි 01 දින සිට නොවැ 30 අතර කාලය තුළ පමණක් මෙම වරප්‍රසාදය ලැබිය හැකි වේ.

සංගමයට දැඩි ලෙස ඇලුම් කරන එහෙත් දැනට සාමාජිකත්වය අහෝසි වී ඇති ඔබ දන්නා අයට මේ පිළිබඳ දැනුම් දෙන මෙන් ඉල්ලා සිටිමු. එලෙස යාවජීව සාමාජිකත්වය ලබා ගැනීමේ අභිලාෂයෙන් පසුවන අය, අවශ්‍ය වැඩිදුර උපදෙස් සඳහා 077-688879 අංකයෙන් එන්.ආර්. අභයසිංහ මහතා සමග සම්බන්ධ වන්න.

---

## ඔබ තාමත් ප්‍රමාද නැහැ

### Felicitation NPAS

Felicitation NPAS යනු අපේ සංගමයේ වංශ කථාවයි. වසර 60 ක් පුරාවට සංගමයේ සියළු අංශයන්ගෙන් කළ කී දෑ මෙන් ම සංවත්සර ඇල්බමයකින් ද සමන්විත මෙම ග්‍රන්ථයේ ඔබේ පිටපත සහනදායී මිලකට ලබා ගැන්මට තවමත් ඔබට හැකියාව ඇත.

රු. 1800/- කට මිල නියම ව ඇති ග්‍රන්ථය රු. 1000/- ක සහනදායී මිලකට ලබාදෙන අවසන් දිනය සාමාජික බොහෝ දෙනාගේ ඉල්ලීම පරිදි ඔක්. 17 තෙක් දීර්ඝ කොට තිබේ.

ඉතින් ඔක්. 17 වන ඉරුදින 60 වන සංවත්සර උළෙල පිළිබඳ විශේෂ මහා සභාවට පැමිණි විට අමරා වීරසේකර මහත්මියට ඔබේ මුදල ලබා දී ලියාපදිංචි වන්න.

### අනුග්‍රාහකත්ව සපයාදීම

Felicitation NPAS අප සංගමයේ දසක හයක වංශ කතාව ජාත්‍යාන්තර ප්‍රමිතියට අනුකූලව සහ පියකරු නිමාවකින් යුතු ව මුද්‍රණයෙන් එළිදැක්වීමට "මුද්‍රණ අනුග්‍රහයක් Printing Sponsorship ලබාදීමට ඔබට හැකියාවක් තිබේ ද? එය මේ මොහොතේ සංගමයට කෙරෙන මහඟු උපකාරයකි.

## ප්‍රභා ලේඛන සංහිතා

ලංකාවේ ප්‍රථම වතාවට නිකුත් කෙරෙන ඡායාරූප ශිල්ප ශාස්ත්‍රීය සංග්‍රහය ඉහළ ම තත්වයකින් යුතු ව එළිදැක්වීම පිණිස මුද්‍රණ වියදම් පියවාගැනීමට ඔබට යම් අනුග්‍රාහකයෙකු සම්බන්ධ කරදිය හැකි ද? මෙය ලාංකීය ඡායාරූප කලාවේ ශාස්ත්‍රීය මංසලකුණකට ඔබගේ මුද්‍රාව සලකුණු කළ හැකි අනුස්මරණීය අවස්ථාවකි. එසේ ම අදත් හෙටත් රෙට බිහිවන ඡායාරූප ශිල්ප විද්‍යාර්ථීන් වෙත කෙරෙන මහඟු අතහිත දීමකි.

වැඩි විස්තර සඳහා නොපමාව උදිත (071 8106680) අමතන්න.

## ඔබ පාසල් ඡායාරූප ශිල්ප ගුරුභවතෙක් ද?

අප සාමාජික භවතුන් පාසල් මට්ටමින් ඡායාරූප ශිල්පය ව්‍යාප්ත කරලීමට විවිධ කැප කිරීම් සිදුකර ඇත. ඒ ගැන ද 60 වන සංවත්සරය අළලා නිකුත්වන Felicitation NPAS ග්‍රන්ථයට එම තොරතුරු ද ඇතුළත් කෙරේ. ඔබත් මේ වන විට කිසියම් පාසලක ඡායාරූප පාඨමාලා උපදේශකවරයෙකු ලෙස ක්‍රියා කරන්නේ නම් ඒ බව නොපමාව උදිතට (071-8106680) දැනුම් දෙන්න.

# නිල ආරාධනා පත්‍රය

**ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ විශේෂ මහා සභා රැස්වීම**

**දිනය : 2010 ඔක්තෝබර් මස 17 ඉරු දින**
**ස්ථානය : කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරය**
**වේලාව : පෙ.ව. 9.00**

**ඉතා වැදගත්, ඔව් ඔබේ පැමිණීම ඉතාම වැදගත්....**

**60 වන සංවත්සරය ගැන තීරණාත්මක කතිකාව සඳහා සංගමය වෙනුවෙන් එදින ඔබේ පැමිණීම ඉතාමත් ම වැදගත් .....**

**මේ සෙනෙහෙබර ආරාධනය**
**ඒ යුතුකම උදෙසා යි ..**

**- ගරු අධ්‍යක්ෂ මණ්ඩලය -**

## ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ 60වන සංවත්සර සැමරුම් උළෙල

මෙම වැඩසටහන 2010 නොවැම්බර් මස 5,6,7 දිනවල කොළඹ ප්‍රදර්ශන හා සම්මේලන මධ්‍යස්ථානයේ දී (SLECC) පැවැත්වීමට විධි විධාන සලස්වා ඇත. 15 වන ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශනය, සංවත්සර සමරු නිකුත් කිරීම, ඡායාරූප ශිල්ප සම්මන්ත්‍රණ, තිළිණ ප්‍රදානය, අධ්‍යාපනික ප්‍රදර්ශනය, ශාස්ත්‍රීය හා සමරු ප්‍රකාශන එළිදැක්වීම, වෙළඳකුටි ප්‍රදර්ශනය ඇතුළු අංග ගණනාවක් මෙම උළෙලට ඇතුළත් වනු ඇත. මේ සියලු කාර්යයන් සඳහා ඔබගේ ශක්තිය, ධෛර්යය, ආශිංසනය, එක් කරලන්නට ගරු අධ්‍යක්ෂ මණ්ඩලය ඇරයුම් කර සිටී.

## 2010 - 60වන සංවත්සර වැඩසටහන් කමිටුව

| කමිටුව | සම්බන්ධීකාරක | ඇමතුම |
|---|---|---|
| ප්‍රධාන මෙහෙයුම් කමිටුව | සුනිල් වික්‍රම මහතා | 071 2726517 |
| තිළිණ ප්‍රදාන අනුකමිටුව | විජය බස්නායක මහතා | 071 8229204 |
| FIAP ප්‍රදර්ශන අනුකමිටුව | එන්.ආර්. අභයසිංහ මහතා | 077 7688879 |
| මූල්‍ය අනුකමිටුව | මංගල එදිරිසිංහ මහතා | |
| ප්‍රකාශන අනුකමිටුව | උ.ග. ගුණසේකර | 071 8106680 |
| සාමාජික සහයෝගිතා අනුකමිටුව | ඒ.ඩී. ගුණරත්න මහතා | 071 6390610 |
| උත්සව සංවිධාන අනුකමිටුව | තිලක වෙරළුපිටිය මහතා | 077 3231676 |
| ආරක්ෂක අනුකමිටුව | චායා අබේවර්ධන මහතා | 077 6114700 |
| පාසැල් වැඩසටහන් අනු කමිටුව | චන්ද්‍රසේන පෙරේරා මහතා | 071 4749435 |
| මාධ්‍ය අනුකමිටුව | යමුණි රශ්මිකා පෙරේරා මහත්මිය | 071 4816364 |
| සංග්‍රහ අනුකමිටුව | චම්පා කුරුප්පු මෙණෙවිය | 077 4698122 |
| සැරසිලි අනුකමිටුව | කුමාර කරවිදෙණිය මහතා | 071 6144223 |
| ශාලා සැලසුම් අනුකමිටුව | ප්‍රියන්ත අබේසුන්දර මහතා | 077 7416663 |
| බැනර් අනුකමිටුව | ජීවනී ශ්‍රියා ප්‍රියන්ති මෙණෙවිය | 071 8183669 |
| වෙළඳ කුටි අනුකමිටුව | සම්පත් පීරිස් මහතා | 071 8202444 |
| අධ්‍යාපනික ප්‍රදර්ශන අනුකමිටුව | වජිර වික්‍රමගේ මහතා | 011 2670790 |
| සමරු භාණ්ඩ අනුකමිටුව | අශෝක බුද්ධදාස මහතා | 071 4402950 |
| පවිත්‍රතා කටයුතු අනුකමිටුව | අශෝක ජේමසිරි මහතා | 071 2238411 |
| සාමාජික දායකත්ව ඇගයීම් අනුකමිටුව | රාහුල පෙරේරා මහතා | 077 7309432 |

සංගමයේ සංවත්සර උළෙලට අදාළ ඉහත දක්වෙන අංශවල ක්‍රියාකාරකම් සාර්ථක ලෙස ඉටු කරගැනීමට ඔබගේ නොමසුරු දායකත්වය අත්‍යවශ්‍ය වේ. ඔබට සංගමය වෙනුවෙන් ඉටු කළ හැකි සෑම ආකාරයක ම දායකත්වයන් සඳහා ඉහත සාමාජික භවතුන් අමතා එම සහයෝගය ලබා දෙන්න. මෙයට අමතරව අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන සම්බන්ධීකරණ වගකීම ද, මෙහෙයුම් හා ඇගයුම් කටයුතු පිළිබඳ වගකීම ද, ප්‍රගති සමාලෝචන කාර්යය ද ඉටුකරනු ඇත.

# Felicitation NPAS
# 60 වන සංවත්සර සැමරුම් කලඹ

අප සංගමයේ දසක හයක ජාතික මෙහෙවර අළලා නිකුත් කෙරෙන විශේෂ සැමරුම් කලඹ සඳහා ඔබගේ දායකත්වය ද එක් කිරීමට සෙනෙහසින් ආරාධනා කර සිටිමු.

මෙම සංවත්සර සැමරුම් කලඹ සංගමයේ එදා මෙදා තුර සියලු තොරතුරු ඇතුළත් කොට සම්පාදනය කරනු ලබන්නකි. සමාරම්භක සාමාජිකයින්, සංගමයේ ක්‍රියාකාරී සාමාජිකයින්, යාවජීව සාමාජික පිරිස, ගෞරව සහාගී සාමාජික භවතුන්, නිලධාරීන් ලෙස වගකීම් ඉසිලූ අය, ශාස්ත්‍රීය වශයෙන් ලබා ඇති ජයග්‍රහණ, සංගමයේ ඉතිහාසය, සමාජසේවා, අධ්‍යාපන, ප්‍රදර්ශන, සුබසාධන කටයුතු පිළිබඳ ඉතිහාසය පිළිබඳ ලිපි මෙහි ඇතුළත් ය. එසේ ම ප්‍රකාශන අංශයේ යටගියාව, වෘත්තීය කණ්ඩායම, ප්‍රභාලේඛිකා සංසදය, පාසල් වැඩසටහන් පිළිබඳ තොරතුරු ද වෙන් වෙන් වශයෙන් මෙයට අඩංගු වේ.

එසේ ම එදා මෙදා තුර අප සාමාජික භවතුන් අතින් නිර්මාණය වූ විශිෂ්ටතම ඡායාරූප 60ක් ද තෝරාගෙන ඇල්බමයක් වශයෙන් මෙම ග්‍රන්ථයට ඇතුළත් කෙරේ.

මෙම විශේෂ සැමරුම් ග්‍රන්ථය වර්තමාන වෙළඳපොළ මිල ගණන් අනුව රු 3500/=- ක් පමණ වුව ද ඊට මිල නියම කොට ඇත්තේ රු. 1800/=- කි එයිනිදු කල්වේලා ඇතිව ඇණවුම් කරන අයට රු 1000/=- කට මෙය ලබාගත හැකි ය. ඒ නිසා ඔබේ ඇණවුම හැකිතාක් ඉක්මනින් රු 1000/=- මුදල ද සහිත ව මේ සමග වන කූපනය පුරවා ඉදිරිපත් කරන්න.

මෙම විශේෂ කලාපය මුද්‍රණය කෙරෙනුයේ පිටපත් ඉතා සීමිත සංඛ්‍යාවක් පමණි. එබැවින් ඔබේ පිටපත නොවරදවා ලබාගැනීම පිණිසත්, මුද්‍රණය සඳහා අත්‍යවශ්‍ය බරපැන යම් තරමකින් හෝ සපුරාගැනීම පිණිසත් කඩිනමින් ඔබේ ඇණවුම ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය කරුණකි. ඔබගේ වැඩිමනත් අවබෝධය පිණිස මෙම ග්‍රන්ථය පිළිබඳ තාක්ෂණික දත්ත පහත දක්වමු.

**Felicitation NPAS සංවත්සර සැමරුම් කලඹ**

| | |
|---|---|
| Pages | : 160 + |
| Inner Pages | : 80 gsm matt paper |
| Cover | : 400 gsm board with 230 gsm laminated jacket. |
| Size | : 210 x 260 mm |
| Selling Price | : Rs. 1800/- |

**Felicitation NPAS ඇණවුම**

නම : ....................................................................

සාමාජික අංකය : ....................................................................

දුරකථන අංකය : ....................................................................

අවශ්‍ය පිටපත් ගණන : ....................................................................

ගෙවනු ලබන මුදල : ....................................................................

.............................. ..............................

දිනය අත්සන

## 60 වන සංවත්සර සැමරුම් කලඹ නොපමාව ඇණවුම් කරන්න

සංවත්සර සැමරුම් කලඹ සඳහා ඔබේ දායකත්වය එක්කරන්නට හොඳ ම අවස්ථාව මෙය වන අතර, අදාළ කූපනය සහ රු. 1000/- මුදල සංගමයේ ඕනෑම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වෙත හෝ උදිත ගුණසේකර මහතා වෙත (071 8106680) භාර දෙන්න. ප්‍රමාද නොවී ඉතිරිව ඇති සීමිත පිටපත් කිහිපයෙන් ඔබේ පිටපත අද ම වෙන්කරවා ගන්න.

---

## සංවත්සර ශාස්ත්‍රීය සංග්‍රහය

අප සංගමයේ 60 වන සංවත්සර සැමරුම අළලා පර්යේෂණ ලිපි ඇතුළත් ශාස්ත්‍රීය සංග්‍රහයක් නිකුත් කිරීමට බලාපොරොත්තු වේ. මේ සඳහා ඇතුළත් කිරීමට අදහස් කරනුයේ ඡායාරූප ශිල්පය, සිනමාව, රූපවාහිනිය, විද්‍යුත් රූප මාධ්‍ය සහ දෘශ්‍ය සන්නිවේදනය යන විෂය ක්ෂෙත්‍රයනට අදාළ ලිපි සමුච්චයකි. සියලු ම ලිපි නව දැනුම සහිත නිරවද්‍ය කරුණු පදනම් කරගත් ශාස්ත්‍රීය ආකෘතියකට අනුව මූලාශ්‍ර ලේඛනයක් ද සහිත ව සම්පාදනය කළ යුතු ය. ලිපි සිංහල හෝ ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කළ හැකි ය.

අප විෂය ක්ෂෙත්‍රය හා සම්බන්ධ පර්යේෂණාත්මක ලිපිවලින් සමන්විත ශාස්ත්‍රීය සංග්‍රහයක් මෙතෙක් අප රටේ නිකුත් වී නොමැති හෙයින් මෙය පුරෝගාමී ජාතික කාර්යභාරයක් වනු ඇත. මෙම අභිමානයේ කොටස්කරුවෙකු වීමේ හිමිකම ඔබට ද ගෞරව සම්ප්‍රයුක්තව පිළිගන්වනු කැමැත්තෙමු. ඒ අනුව මෙම ශාස්ත්‍රීය සංග්‍රහය සඳහා ලිපියක් සකස් කිරීමට ඔබ අදහස් කරන්නේ නම් 2010 ඔක්තෝබර් 10 දිනට ප්‍රථම අදළ මාතෘකාව ද සමගින් 071-8229204 අංකයෙන් විජය බස්නායක මහතා අමතන්න.

## හිතවත් සාමාජික සාමාජිකාවනි,

අප සංගමයේ වෙබ් අඩවිය යාවත්කාලීන කර ඇති බව සතුටින් දැනුම් දෙමි. සංගමයේ නව පුවත් හා ක්‍රියාකාරකම් දැනගැනීමට ඔබට අවශ්‍ය නම් www. npasslanka.org යන සංගමයේ වෙබ් අඩවියට පිවිසීමට හැකියාව ඇත.

ඔබට සංගමයේ "පිළිසඳර" කලාපය වෙබ් අඩවියේ Publication පිටුවට ගොස් නැරඹිය හැකි ය.

ඔබ "පිළිසඳර" කලාපය ඔබගේ විද්‍යුත් ලිපිනයට ගෙන්වාගැනීමට කැමති නම් ඔබගේ නම, විද්‍යුත් ලිපිනය, සාමාජික අංකය, සංගමයේ විද්‍යුත් ලිපිනය වන npas @ sltnet.lk වෙත දැනුම් දෙන්න. එවිට පිළිසඳර සඳහා මුද්‍රණ වියදම් හා තැපැල් වියදම් ඉතිරි කරගත හැකි වනු ඇත.

## සාමාජිකත්වය රැකගනිමු

දෙවසරකට වැඩි කලක් සාමාජික මුදල් නොගෙවූ සියලු දෙනාගේ සාමාජිකත්වය අහෝසි කිරීමට සිදුවේ. එබැවින් ඔබගේ හිඟ සාමාජික මුදල් වේ නම් එය පියවා සාමාජික වරප්‍රසාද රැක ගැනීමට කඩිනමින් ක්‍රියාත්මක වන මෙන් මෙයින් ඉල්ලා සිටිමු. 60 වන සංවත්සරය ඔබේ සාමාජික හිමිකම්වලට වඩාත් ඉහළ වටිනාකමක් ලැබෙන්නා වූ අවස්ථාවකි. එසේ ම සංවත්සර සැමරුම් උළෙල සඳහා ඔබගේ දායකත්වය එක් කිරීමේ පළමු නිල කාර්යය වන්නේ ද සාමාජිකත්වය රැක ගැනීම ය. එහෙයින් හිඟ සාමාජික මුදල් වේ නම් මුදලින්, චෙක්පතකින් හෝ ඔක්. 17 විශේෂ මහා සභාවට පැමිණීමෙන් එය ගෙවිය හැකි ය. මේ පිළිබඳ විමසුමක් වෙතොත් මුදල් අධ්‍යක්ෂ මංගල එදිරිසිංහ මහතා අමතන්න.

# Club 60 - හැටේ කණ්ඩායම

සංගමයේ 60 වන සැමරුම සහ ඔබේ 60 වන ජීවිත සැමරුම එක ම වසරක සිදු වේ ද?. එසේ නම් හැටේ සාමාජික කණ්ඩායමේ සාමූහික උපන් දින උත්සවය ඔබගේ ද දායකත්වයෙන් නොවැම්බර් මස මුල් සතියේ පැවැත්වෙන සංගමයේ සංවත්සර උළෙලේ දී සංවිධානය කළ හැකි ය. වැඩි විස්තර සඳහා 071 8106680 අංකයෙන් උදිත අමතන්න.

# 60 වන සංවත්සරයේ ඔබේ දායකත්වය

මේ ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය වෙනුවෙන් ඔබේ දායකත්වය අවශ්‍ය ම මොහොතයි.

දසක හයක අභිමානවත් ජාතික මෙහෙවරක් ඉටුකළ පුරෝගාමී ආයතනයක කොටස්කරුවන් ලෙස ඔබ ද එකී ජාතික සේවාවේ ප්‍රණාමලාභීහු වෙති. මෙතෙක් අධ්‍යාපන, සමාජ, සංස්කෘතික, වෘත්තීය සහ සුබසාධන වශයෙන් අප සංගමයෙන් ඉටු කෙරුණු සේවාව ඉදිරි පරපුරට උරුම කරදීමේ සංධිස්ථානය වන්නේ ද එළැඹ ඇති මෙම 60 වන සංවත්සරයයි. එබැවින් 60 වන සැමරුම් උළෙළ සඳහා විවිධාකාරයෙන් ඔබට එක් කළ හැකි ආශිර්වාද, දායකත්ව, කැපකිරීම් මත සංගමයේ සහ අප සැමගේ ගෞරවය, සංතෘප්තිය, අභිමානය වර්ධනය කරලීමට කැපවෙමු.

නොවැම්බර් මස 05, 06, 07 දිනවල කොළඹ ජේ.ආර්. ජයවර්ධන මාවතේ ජාතික ප්‍රදර්ශන සහ සම්මන්ත්‍රණ ශාලාවේ (SLECC) පැවැත්වීමට විධිවිධාන යොදා ඇති මෙම උළෙලට ඔබට සම්බන්ධ විය හැකි ආකාර ගණනාවකි. එය පහත සඳහන් කරන්නේ, එහි වැදගත්කම ඔබට තේරුම් කරදීමේ අභිලාෂයෙන් නොව එය යළි සිහිපත් කරලීමේ අටියෙනි. මෙයට පෙරාතුව කරන ලද දැනුම්දීම් සහ පිළිසඳරෙහි කළ පළ කිරීම් අනුව ඇතැම් විට මෙම ක්‍රියාකාරකම්, දායකවීම්, බොහොමයක් ඔබ දැනටමත් හමාර කොට තිබිය හැකි ය. එසේ නම් ඔබ දන්නා සංගමයේ සෙසු සාමාජික සහෝදරත්වය ඒ සඳහා පෙළඹවීම ද නොඑසේ නම් පළමු කොට සංගමය වෙනුවෙන් ඔබේ දායකත්වය සඳහා ඉදිරිපත් වීම ද අරමුණු කොටගෙන මෙම සටහන ලියා දක්වමු.

1. ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශනයට නිර්මාණ ඉදිරිපත් කිරීම.
2. සංවත්සර සමරු ටී ෂර්ටය ලබාගැනීම.
3. සංවත්සර සමරු මග්එක ලබාගැනීම.
4. Felicitation NPAS සැමරුම් ග්‍රන්ථය සඳහා ලියාපදිංචි වීම
5. 60 වන සැමරුම් මුද්දරය ලබාගැනීමට ලියාපදිංචි වීම
6. ප්‍රභාලේඛන සංහිතා ශාස්ත්‍රීය සංග්‍රහය මිල දී ගැනීම.
7. සංවත්සර ස්ටිකරය මිල දී ගැනීම.
8. සංවත්සර උළෙල සඳහා වෙළඳ කුටි සපයාදීම.
9. සංවත්සර වැඩසටහන් උත්සවාංග සඳහා අනුග්‍රාහකයින් සම්බන්ධ කරදීම.
10. සංවත්සර උළෙලේ ප්‍රචාරණ කටයුතු සඳහා දායක වීම.
11. සංවත්සර උළෙලේ කාර්ය මණ්ඩලයට එක්වීම.
12. සංවත්සර උළෙලේ වැඩසටහන් සඳහා දින තුන පුරා සහභාගීත්වය

අවශ්‍ය වැඩි විස්තර සඳහා ගරු සභාපති සුනිල් වික්‍රම මහතා (071 2726517) හෝ අන් ඕනෑ ම අධ්‍යක්ෂ මණ්ඩල භවතෙකු අමතන්න.

---

## සංජයගේ 'බටර්ෆ්ලයි' සිනෙමැඩරාමා උළෙලේ අවසන් වටයට

අප සංගමයේ සාමාජික සංජය නාවුල්ලගේ 'බටර්ෆ්ලයි' කෙටි චිත්‍රපටය ඉතාලියේ පැවැත්වෙන සිනෙමැඩරාමා තරුණ කෙටි චිත්‍රපට උළෙලේ අවසන් වටයට තෝරාගෙන ඇති අතර, අවසන් වටයට තෝරාගෙන ඇති කෙටි චිත්‍රපටකරුවන් සඳහා මාසයක වැඩමුළුවක් පැවැත්වීමට ද සංවිධායකවරු කටයුතු යොදා ඇත.

ඔහුගේ මෙම ජයග්‍රහණය පිළිබඳ සංගමයේ සුබපැතුම් ඔහුට පිරිනමමු.

## සුජානිගේ 'නික්මන' සම්මානයට පාත්‍රවේ.

අප සංගමයේ සාමාජිකා සුජානි සෙව්වන්දිගේ 'නික්මන' කෙටි චිත්‍රපටය 2010 වෙසක් උළෙල වෙනුවෙන් සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය මගින් සංවිධානය කරන ලද අන්තර් ජාතික කෙටි චිත්‍රපට උළෙලේ සම්මානනීය කෘතියක් ලෙස සම්මානයට පාත්‍ර විය.

ඇයගේ මෙම ජයග්‍රහණය පිළිබඳ සංගමයේ සුබපැතුම් ඇයට පිරිනමමු.

## 'අද වගේ දවසක ඇන්ටිගනි'

අප සංගමයේ සාමාජික ප්‍රියංකර රත්නායක මහතාගේ නවතම නාට්‍යය ඇන්ටිගනි නිෂ්පාදනය 'අද වගේ දවසක ඇන්ටිගනි' නමින් ජූලි මස 16,17 දිනවල ලයනල් වෙන්ඩ්ට් හි දී වේදිකාගත කෙරිණි.

## 'Sea is our Life' කෙටි චිත්‍රපටය

අප සංගමයේ සාමාජිකා වරුණි අනුරුද්ධිකා චන්ද්‍රසේනගේ සම අධ්‍යක්ෂණයක් වන 'Sea is our Life' කෙටි චිත්‍රපටය Alliance Francaise හි දී පසුගියදා ප්‍රදර්ශනය කෙරිණ.

## 'තෙවැනි ඇස' ඡායාරූප ප්‍රදර්ශනය

අප සංගමයේ සාමාජික අජිත් ප්‍රියතිලකගේ 'තෙවැනි ඇස' - පළමු ඒකපුද්ගල ඡායාරූප ප්‍රදර්ශනය 2010 අප්‍රේල් 15,16,17 දිනවල ලංකාගම කණිටු විදුහලේ දී පවත්වනු ලැබීය.

මෙහි සොබා දහම සහ වෙනත් කලාත්මක අරමුණු ඇතුළත් ඡායාරූප දක්නට ලැබිණි.

## නිරෝගී සුව පතමු.

- අප සංගමයේ හිටපු අධ්‍යාපන අධ්‍යක්‍ෂ ශාන්තිලාල් ප්‍රනාන්දු මහතාගේ පියාණන් පසුගියදා රෝහල්ගත කර ඇත. එතුමන්ට ඉක්මන් සුවය පතමු.
- ජ්‍යෙෂ්ඨ සාමාජික වෛද්‍ය බර්ට්‍රම් ප්‍රනාන්දු මහතා හදිසි ශල්‍යකර්මයකට බඳුන් කරන ලදුව දැනට සුව අතට හැරෙමින් සිටී. ඒ මහතාට ඉක්මන් නිරෝගි සුව ප්‍රාර්ථනා කරමු.
- සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු වන ෂෙල්ටන් කැකුළුවලගේ මහතා හදිසියේ රෝගාතුර විය. දැනට සුව අතට හැරෙමින් සිටින ඒ මහතාට ඉක්මන් නිරෝගී සුව පතමු.
- ජ්‍යෙෂ්ඨ සාමාජිකා චම්පා කුරුප්පු මෙණෙවිය හදිසි අනතුරකට ලක් වී දැනට ප්‍රතිකාර ලබමින් පසුවන්නීය. ඇයගේ සෞඛ්‍ය තත්වය කඩිනමින් යථා තත්වයට පත්වේවා යි ප්‍රාර්ථනා කරමු.

## ශාන්ත වීරසිංහ යළි පැමිණේ.

ඉතා පැරණි සාමාජිකයෙකු වන ශාන්ත වීරසිංහ මහතා වසර 30 කට පසු ලංකාවට පැමිණ සිටී. ඒ මහතා පසුගිය ජූලි මස මාසික තරග විනිශ්චය කර ඡායාරූප පිළිබඳ අදහස් දැක්වූ අවස්ථාව.

## අපගේ ශෝකය

- ප්‍රවීණ ඡායාරූප ශිල්පියෙකු, කෘතහස්ත කලාවේදියෙකු සේ ම විද්‍යුත් මාධ්‍ය සජීවීකරණ කලාවේ ප්‍රගමනයට දායක වූ පාලිත ලක්‍ෂ්මන් ද සිල්වා මහතා පසු ගිය දා අප අතරින් වියෝ විය. ඒ පිළිබඳව සංගමයේ සියලු දෙනාගේ හදපිරි ශෝකය ප්‍රකාශ කරමු.
- සංගමයේ හිටපු විධායක අධ්‍යක්‍ෂවරයකු වන තිලක වෙරළුපිටිය මහතාගේ මාමණ්ඩිය පසුගිය දා අප අතරින් වියෝ විය. ඒ පිළිබඳ සංගමයේ බලවත් ශෝකය ප්‍රකාශ කරමු.
- සංගමයේ විධායක අධ්‍යක්‍ෂ T.S.T. ද සිල්වා මහතාගේ මාමණ්ඩිය පසුගිය දා අප අතරින් වියෝ විය. ඒ පිළිබඳ සංගමයේ බලවත් ශෝකය ප්‍රකාශ කරමු.
- සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික රොෂාන් ප්‍රනාන්දු මහතාගේ පියාණන් පසුගිය දා අභාවප්‍රාප්ත විය. ඒ පිළිබඳව සංගමයේ බලවත් කණගාටුව ප්‍රකාශ කරමු.
- සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකා පාලිකා වික්‍රමාරච්චි මහත්මියගේ පියාණන් පසුගිය දා අප අතරින් වියෝ විය. ඒ පිළිබඳව සංගමයේ බලවත් කණගාටුව ප්‍රකාශ කරමු.
- අප සංගමයේ සාමාජික S.A.U.T. සමරසිංහ මහතාගේ පියාණන් පසුගියදා අභාවප්‍රාප්ත විය. ඒ පිළිබඳව අප සංගමයේ බලවත් ශෝකය.
- ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු වූ ලීලානන්ද ඉන්ද්‍රවංශ මහතාගේ දයාබර මෑණියන් පසුගිය දා අභාවප්‍රාප්ත විය. ඒ පිළිබඳ සංගමයේ ශෝකය පිරිනැමේ.
- සාමාජික කුමාර දහනායක මහතාගේ මෑණියන් පසු ගිය දා අභාවප්‍රාප්ත වූවා ය. දහනායක මහතා ඇතුළු පවුලේ සැම වෙත සංගමයේ ශාතිශය සංවේගය පළ කරමු.

## ශ්‍රී ලංකා ඡායාරූප සංගමයේ (PSSL) 55 වන ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශනය

ශ්‍රී ලංකා ඡායාරූප සංගමය (ලයනල් වෙන්ඩ්ට් ඡායාරූප සංගමය) මගින් වාර්ෂික ව පවත්වනු ලබන 55 වන ජාත්‍යන්තර ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශනය 2010 නොවැම්බර් මස 25, 26, හා 27 යන දිනවල කොළඹ ලයනල් වෙන්ඩ්ට් කලාගාරයේ හැරල්ඩ් පීරිස් ප්‍රදර්ශන ශාලාවේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙහි කෘති භාරගැනීම පසුගිය දා අවසන් වුණු අතර, කෘති තේරීම ද පසුගිය දා සිදුකරනු ලැබී ය.

## Galle Professional Eye ඡායාරූප සංගමය

ගාලු පුරවරයේ වෘත්තීය වශයෙන් ඡායාරූපකරණයේ නියැලී සිටින ඡායාරූප ශිල්පීන්ගේ එකමුතුවක් ලෙස Galle Professional Eye ඡායාරූප සංගමය පසුගිය දා පිහිටුවා ගන්නා ලදී. අප සංගමය සමග එකමුතු ව කටයුතු කිරීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති එම සංගමය සමග කටයුතු කිරීමට දකුණු ලක වෙසෙන ඡායාරූප ශිල්පීන් කැමැත්තක් දක්වන්නේ නම් ඒ සඳහා එම සංගමයේ සභාපතිවරයා වන උදය මුණසිංහ මහතා 077 3639111 අංකයෙන් ඇමතිය හැකි ය.

## සාමාජික නම් ඉවත් කිරීම.

වසර 03 ක් පුරා වාර්ෂික සාමාජික මුදල් නොගෙවූ සාමාජිකයින් හට ඒ පිළිබඳව ලිඛිත ව දැනුම් දීමෙන් අනතුරුව ඒ පිළිබඳ ව ප්‍රතිචාර නොදැක්වූ සාමාජික පිරිසකගේ නම් සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට අධ්‍යක්‍ෂ මණ්ඩලය පියවර ගත්තේ ය. ඔබගේ ද සාමාජික මුදල් කුමන කාරණයක් නිසා හෝ ගෙවීම මගහැරී ඇත්නම් හැකි ඉක්මනින් එම හිඟ සාමාජික මුදල් ගෙවීමට කටයුතු කර සාමාජිකත්වය තහවුරු කරගන්නා ලෙස මෙසේ දන්වමු.

## www.npasslanka.org සංගමයේ වෙබ් අඩවිය

උක්ත ලිපිනයැති සංගමයේ වෙබ් අඩවියෙහි සාමාජික ඔබසැමගේ ද නම් ඇතුළත් කිරීමට තීරණය කොට ඇත. ඒ සමග පළකිරීම පිණිස ඡායාරූප ශිල්පයේ ඔබ විශේෂ නිපුණතාවක් දක්වන ක්‍ෂේත්‍රය/ක්‍ෂේත්‍ර කවරේ දැයි සැම දිනක ම ප.ව. 8.00 ත්- 9.00 ත් අතර දුරකථනයෙන් උපුල් රණේපුර (071 600 5 600) වෙත දැනුම් දෙන්න. පිටස්තරව විද්‍යුත් කැපැල් මගින් සිදුකෙරෙන සාමාජික ආමන්ත්‍රණ සහ විමසීම් සඳහා member@npasslanka.org ලිපිනය විවෘතව තැබෙනු ඇත.


පිළිසඳරට **වෙහෙස මහන්සිය**

ප්‍රකාශන අධ්‍යක්‍ෂ - නාරද අමරතුංග

ප්‍රකාශන අනු කමිටුව

ශාන්ත ගුණරත්න

ඉන්දික රත්නායක

විමල් ප්‍රියශාන්ත

නිශාන්ත ප්‍රියදර්ශන

දර්ශනී චතුරිකා